රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 7/2007 (III)

මගේ අංකය :- EST-2/POLCY/03/0797
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2012.07.10

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම</u>**

ඉහත මැයෙන් 2007.05.28 දාතමින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 සහ 2007.08.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 (I) කෙරේ ඔබේ අවධානය යොමු කරවමි. එකී චක්‍රලේඛයන්හි විධිවිධාන පහත සඳහන් ආකාරයෙන් සංශෝධනය කිරීමට 2012.05.23 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

02. ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හි පළමු ඡේදයේ (අ) යටතේ සඳහන් 2007.07.01 දින සිට රාජ්‍ය සේවයට/ පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන/ පත්කරනු ලබන නිලධාරීන් වසර 05 ක් තුළ ලබාගත යුතු අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීම සඳහා සහන කාලයක් පහත සඳහන් පරිදි ලබා දෙනු ලැබේ.

I. 2007.07.01 දින සිට 2010.06.30 දින දක්වා රාජ්‍ය සේවයට බඳවා ගනු ලැබූ/ පත්කරනු ලැබූ නිලධාරීන්ට නියමිත භාෂා ප්‍රවීණතා මට්ටම අත්කර ගැනීම සඳහා දැනට ලබාදී ඇති වසර පහක (05) කාල සීමාවට අතිරේක වශයෙන් තවත් වසර දෙකක (02) සහන කාල පරිච්ඡේදයක් ලබාදීම

03. තවද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හි 2 වන ඡේදයේ සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 (I) හි 03 ඡේදයේ සඳහන් විධිවිධාන පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

I. "වැටුප් වර්ධක විලම්භනය කිරීම" යන්න "වැටුප් වර්ධක නතර කිරීම" යනුවෙන් සංශෝධනය කිරීම

04. වැටුප් වර්ධක නතර කර ඇති අවස්ථාවකදී නිලධාරියාට අදාළ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත් විට එකී ප්‍රවීණතාව ලබා ගැනීමට ගත වූ කාලය තුළදී එළඹීමට හැකිව තිබූ වැටුප් පියවරේ තැබිය යුතු අතර හිඟ වැටුප් නොගෙවිය යුතුය. එසේම, නිලධාරියාගේ වැටුප් වර්ධක දිනයේ වෙනසක් සිදුනොවේ.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය